සියලු ම හිමිකම් ඇවිරිණි. | රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

87 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

87 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය

පළමු ප්‍රශ්න පත්‍රයට ලකුණු 1 x 40	-	40
දෙවන ප්‍රශ්න පත්‍රය සඳහා	-	60
මුළු ලකුණු	-	100

II වන පත්‍රය

1 වන අනිවාර්ය ප්‍රශ්නයට ලකුණු 02 බැගින් 10	-	20
2 වන - 7 වන ප්‍රශ්න සඳහා තෝරා ගත් ප්‍රශ්න 4 ලකුණු 10 බැගින්	-	40
		60

කොටස් ලකුණු බෙදීම

2 - 6 දක්වා සෑම ප්‍රශ්නයක් සඳහා

I කොටසට	-	ලකුණු	1
II කොටසට	-	ලකුණු	2
III කොටසට	-	ලකුණු	3
IV කොටසට	-	ලකුණු	4
			10

I - ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ

බහුවරණ ප්‍රශ්ණ පත්‍රයේ ඇති සියලුම ප්‍රශ්න දැනුම උරගා බැලීමක් සහ දිනපතා ජීවිතයට අදාළ කර ගැනීමේ හැකියාව තහවුරු කිරීමත් අපේක්ෂිත ය. ඒ සඳහා 10 සහ 11 ශ්‍රේණි පොත් නිසියාකාරව හදාරා තිබීම වැදගත් ය. වරණ අතුරින් ඉතා ම සුදුසු වරණය තේරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවනට හැකි වීම මෙහිදී බලාපොරොත්තු වේ.

මෙම පත්‍රයේ එක් ප්‍රශ්නයකට එක ලකුණ බැගින් හිමි වේ. I වන පත්‍රයට හිමිවන මුළු ලකුණු ගණාන 40 කි.

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020 (2021)
උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i)	....	√	△ $\frac{4}{5}$
(ii)	....	√	△ $\frac{3}{5}$
(iii)	....	√	△ $\frac{3}{5}$
(03)	එකතුව	→	□ $\frac{10}{15}$

බහුවරණ උත්තරපත්‍ර :

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
V. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.

***

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

87 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

I පත්‍රය

ආවරණය කරනු ලබන ඉගෙනුම් ඵල

01. සන්නිවේදන ක්‍රියාවලිය ද්විමාර්ගික ක්‍රියාවලියක් බව හේතු සහිතව පෙන්වා දෙයි.

02. අතීතයේ සිට මේ දක්වා භාවිතවන කැපී පෙනෙන ශ්‍රව්‍ය සන්නිවේදන ක්‍රම හා දෘශ්‍ය සන්නිවේදන ක්‍රම ලැයිස්තු ගත කරයි.

03. අවිධිමත් සන්නිවේදනය සිදුවන ආකාරය ආකෘති ඇසුරින් විස්තර කරයි.

04. පුද්ගලයා තුළ අන්තර්වර්ති සන්නිවේදන ක්‍රියාදාමය සිදුවන ආකාරය පිළිබඳව ජීව විද්‍යාත්මක තොරතුරු විශ්ලේෂණය කරයි.

05. සන්නිවේදන ක්‍රියාවලියක් සාර්ථකව සිදු කිරීම සඳහා සැලකිල්ලට ගත යුතු ක්‍රියාමාර්ග පෙන්වා දෙයි.

06. සන්නිවේදන මාධ්‍යයක් ලෙස රූපවාහිනී මාධ්‍යයේ ස්වභාවය හඳුන්වයි.

07. පුද්ගල චර්යා පාලනයට අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය හේතුවන ආකාරය සාකච්ඡා කරයි.

08. මාධ්‍ය නිර්මාණය හා සබැඳි නීති පෙන්වාදෙයි

09. තෝරාගත් පුවත්පත් ආයතනයක සංවිධාන ව්‍යුහයට අයත් එක් එක් අංශයක ක්‍රියාකාරිත්වය පිළිබඳ මූලික තොරතුරු විශ්ලේෂණය කරයි.

10. විවිධ ප්‍රභේද අනුව පුවත්පත් වර්ගීකරණය කරයි.

11. ජනමාධ්‍ය මගින් සමාජීය නියෝජනය සිදුවන ආකාරය විස්තර කරයි.

12. විවිධ රූපවාහිනී නාලිකාවල ප්‍රකාශයට පත්වන වැඩසටහන් අධ්‍යයනය කරයි.

13. විචාරශීලි ග්‍රාහකත්වය යන්න හඳුන්වයි.

14. ගුවන් විදුලි වැඩසටහන් ප්‍රභේද නම් කරයි.

15. ජනමාධ්‍ය ආයතන ක්‍රියාකාරිත්වය කෙරෙහි රජයේ මැදිහත් වීමේ ස්වභාවය හඳුනා ගනියි.

16. ජනමාධ්‍ය අරමුණු හා ග්‍රාහක අරමුණු අතර විවිධතා අධ්‍යයනය කරයි.

17. ගුවන් විදුලි මාධ්‍යයේ ආවේනික ස්වභාවය විස්තර කරයි.

18. වර්තමානයේ භාවිතවන තොරතුරු හුවමාරු කිරීමේ උපකරණ නම් කරයි.

19. විවිධ රූපවාහිනී නාලිකාවල ප්‍රකාශයට පත්වන වැඩසටහන් අධ්‍යයනය කරයි.

20. ප්‍රවෘත්තියක වටිනාකම කෙරෙහි බලපාන සාධක හඳුන්වයි.

21. ප්‍රවෘත්ති අන්තර්ගතය සලකා ප්‍රවෘත්ති වර්ග කරයි.

22. ප්‍රවෘත්ති අන්තර්ගතය සලකා ප්‍රවෘත්ති වර්ග කරයි.

23. ගුවන්විදුලි වැඩටහන් නිෂ්පාදනයට අවශ්‍ය ශිල්පීය උපයාමාර්ග හඳුන්වයි.

24. ශ්‍රී ලංකාවේ විවිධ මාධ්‍ය ආයතන හිමිකම යටතේ ප්‍රභවය වූ මාධ්‍ය ආයතන පිළිබඳ තොරතුරු අනාවරණය කරයි.

25. පන්ති කාමරවල මාධ්‍ය උපකරණ භාවිත කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

26. ජනමාධ්‍ය ආයතනවල හිමිකම් ස්වභාවය හඳුනා ගනියි.

27. සිනමා හා රූපවාහිනි මාධ්‍යයෙහි භාවිතය සඳහා නිශ්චල ඡායාරූප භාවිතයේ අවශ්‍යතාව පෙන්වාදෙයි.

28. මාධ්‍ය නිර්මාණ භාවිතයේදී ආචාරධර්ම, නීති පිළිපදිමින් කටයුතු කරයි.

29. විවිධ මුද්‍රිත මාධ්‍යයන්හි භාවිතය වෙන් වෙන් වශයෙන් අගය කරයි.

30. මාධ්‍ය නිර්මාණයක් හා සබැඳි ආචාරධර්ම, නීති පැවැත්මේ අවශ්‍යතාව තහවුරු කරයි.

31. පන්ති කාමර මාධ්‍ය උපකරණ භාවිතා කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

32. මිනිසා ලේඛනයට යොමු වූ ආකාරය ඉදිරිපත් කරයි.

33. ගුවන් විදුලි මාධ්‍යයේ නව ප්‍රවණතා භාවිතය විමර්ශනය කරයි.

34. ගුවන් විදුලි මාධ්‍යයේ ආවේණික ස්වභාව විග්‍රහ කරයි.

35. ජනමාධ්‍ය ආයතන කෙරෙහි රජයේ මැදිහත්වීමේ ස්භාවය හඳුනා ගනියි.

36. තොරතුරු හුවමාරු කිරීමේ මාධ්‍ය උපකරණ නම් කරයි.

37. සන්නිවේදන ඉතිහාසයේ සන්ධිස්ථාන විස්තර කරයි.

38. තෝරාගත් පුවත්පත් ආයතනයක සංවිධාන ව්‍යුහයට අයත් එක් එක් අංශවල ක්‍රියාකාරීත්වය සරලව විග්‍රහ කරයි.

39. කැමරාවේ අංගෝපාංගවල ක්‍රියාකාරීත්වය වෙන වෙනම විග්‍රහ කරයි.

40. ජනමාධ්‍ය ග්‍රාහකයා වෙතත්, ග්‍රාහකයා මාධ්‍ය වෙතත් අනන්‍යනව බලපෑම් කිරීමේ අවශ්‍යතාව තහවුරු කරයි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

87 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக் கல்வியும் **I, II**
Communication and Media Studies **I, II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

සැලකිය යුතුයි:

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. සන්නිවේදනය ද්වි-මාර්ගික ක්‍රියාවලියකි. මෙයින් අදහස් වන්නේ,
(1) සන්නිවේදනයේ දී ග්‍රාහකයකු සිටිය යුතු බවයි.
(2) ප්‍රතිපෝෂණයක් සිදුව නැති බවයි.
(3) සන්නිවේදකයා ග්‍රාහකයා විය හැකි බවයි.
(4) ඝෝෂා අවම මට්ටමක ඇති බවයි.

2. සිතියමක් අයත් වන්නේ,
(1) ලිඛිත, දෘෂ්‍ය සන්නිවේදනයට ය.
(2) අවිධිමත්, දෘෂ්‍ය සන්නිවේදනයට ය.
(3) නිර්වාචික, විධිමත් සන්නිවේදනයට ය.
(4) විධිමත්, අලිඛිත සන්නිවේදනයට ය.

3. එක් අයෙකු විසින් වැඩි පිරිසක් වෙත තොරතුරු සන්නිවේදනය කරනු ලබන අවිධිමත් සන්නිවේදන විධි ක්‍රමය වන්නේ,
(1) පර්ෂද දාමයයි. (2) තනි දාමයයි. (3) ඕපාදූප දාමයයි. (4) සම්භාවිතා දාමයයි.

4. අර්ථකථනය කරමින් සන්නිවේදනයේ යෙදීම අයත් වන්නේ,
(1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයටයි. (2) අන්තර්පුද්ගල සන්නිවේදනයටයි.
(3) සමූහ සන්නිවේදනයටයි. (4) ජන සන්නිවේදනයටයි.

5. කෙනෙකුගේ පංචේන්ද්‍රියයන් මගින් ලැබෙන සංදේශ ග්‍රහණය කරගෙන එය තේරුම් කර ගැනීම
(1) අර්ථකථනයයි. (2) සංජානනයයි.
(3) සන්නිවේදනයයි. (4) බලපෑමයි.

6. රූපවාහිනී මාධ්‍යයේ ලක්ෂණයක් වන්නේ,
(1) සන්නිවේදක හා ග්‍රාහක අභිමුඛවීමයි. (2) නිශ්චිත ග්‍රාහක පිරිසක් සිටීමයි.
(3) ද්විමාර්ගික සන්නිවේදනයක් සිදුවීමයි. (4) පොදු සංදේශ ඉදිරිපත් කිරීමයි.

7. ටෙලි නාට්‍යයක් නරඹමින් සිටින අතරතුර එහි එක් ජවනිකාවක් හේතුවෙන් ඔබේ මුවට සිනහවක් පහළ වූයේ යැයි සිතන්න. මෙහිදී සිදුවූයේ,
   (1) ඍජු පෙළඹවීමකි. (2) ප්‍රතිපෝෂණ ක්‍රියාවකි.
   (3) උත්තේජන ප්‍රතිචාරයකි. (4) ද්විමාර්ගික සන්නිවේදනයකි.

8. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි තොරතුරු ලැබීමට හා දීමට ඇති අයිතිය තහවුරු කෙරෙන වගන්තිය කුමක් ද?
   (1) 15 (i) (2) 15 (ii) (3) 19 (4) 21

9. පුවත්පතක ප්‍රවෘත්ති පිටුව සංස්කරණය කරනු ලබන්නේ,
   (1) ප්‍රධාන කර්තෘ විසිනි.
   (2) නියෝජ්‍ය කර්තෘ විසිනි.
   (3) උප කර්තෘවරයෙක් විසිනි.
   (4) මාණ්ඩලික වාර්තාකරුවෙක් විසිනි.

10. ටැබ්ලොයිඩ් (Tabloid) සහ බ්‍රෝඩ් ෂීට් (Broad Sheet) ආදි ලෙස පුවත්පත් බෙදා දැක්වීමේ දී මූලික වී ඇත්තේ
   (1) පුවත්පතෙහි ප්‍රමාණයයි. (2) පුවත්පත පළවන වාරයයි.
   (3) කේන්ද්‍රීය විෂයයි. (4) භාවිත කරන පාඨකයායි.

11. සියලු ආගම් හා ජාතීන්ට ගරු කිරීම, නීතිගරුකභාවය, ආචාරශීලීත්වය හා ඡන්ද අයිතිය යන කරුණු ඍජුව අදාළ වන්නේ,
   (1) මානව හිමිකම්වලට ය. (2) ප්‍රජාතන්ත්‍රවාදයට ය.
   (3) පුරවැසිභාවයට ය. (4) වාර්ගිකත්වයට ය.

12. දීර්ඝ කාලයක් තිස්සේ කරනු ලබන පර්යේෂණ මත පදනම් වූ රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදය වනුයේ,
   (1) සජීවී විස්තර කථනයන් ය. (2) ප්‍රවෘත්ති වැඩසටහන් ය.
   (3) රියැලිටි වැඩසටහන් ය. (4) වාර්තා වැඩසටහන් ය.

13. මාධ්‍ය සංදේශ පරිහරණය කිරීමේ දී, විචාරශීලි ග්‍රාහකයෙක් සතු ලක්ෂණයක් **නොවන්නේ**, පහත සඳහන් ඒවායින් කුමක් ද?
   (1) විශ්ලේෂණ කිරීමයි.
   (2) වගකීමෙන් පරිහරණය කිරීමයි.
   (3) අන්තර්ගතය එලෙසම ජීවිතයට ආදේශ කර ගැනීමයි.
   (4) නිර්මාණය කිරීමේ අරමුණු හඳුනාගැනීමයි.

14. ඔබ පාසලේ පැවැත්වෙන ක්‍රීඩා තරගයක් එම මොහොතේ දී ම ගුවන්විදුලි මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කිරීම සඳහා යොදා ගත හැකි වැඩසටහන් ආකෘතිය වන්නේ,
   (1) ප්‍රවෘත්ති වැඩසටහනකි. (2) වාර්තාමය වැඩසටහනකි.
   (3) නිවේදනයකි. (4) විස්තර ප්‍රචාරයකි.

15. රූපවාහිනී නාලිකාවක් ආරම්භ කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීමේ දී ඍජුව මැදිහත් වන ආයතනයක් වන්නේ,
   (1) ජනමාධ්‍ය අමාත්‍යාංශයයි. (2) විදුලි සංදේශ නියාමන කොමිසමයි.
   (3) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවයි. (4) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයයි.

16. මාධ්‍ය කර්මාන්තයේ සාර්ථකත්වය රඳා පවතිනුයේ ග්‍රාහකයාගේ,
   (1) රුචි අරුචිකම් මතයි. (2) පාරිභෝගික වටිනාකම මතයි.
   (3) සංදේශ ප්‍රතිග්‍රහණය මතයි. (4) මාධ්‍ය සාක්ෂරතාව මතයි.

17. පුවත්පතට හා රූපවාහිනියට සාපේක්ෂව ගුවන්විදුලිය සුවිශේෂ වන්නේ එහි දී
   (1) හඬ භාවිත කෙරෙන බැවිනි. (2) භූගෝලීය බාධක විරල බැවිනි.
   (3) සාක්ෂරතාව අත්‍යවශ්‍ය නොවන බැවිනි. (4) පුද්ගල කේන්ද්‍රීය වූවක් බැවිනි.


18. ඔබ අතැති නිල මුද්‍රාව සහිත ලේඛනයක් ක්ෂණිකව වෙනත් දුරස්ථ ස්ථානයක් වෙත යොමු කිරීම සඳහා යොදා ගත හැකි උපකරණය වන්නේ,

(1) ඩිජිටල් අනුපිටපත් යන්ත්‍රයයි. (2) තැපැල් මුද්‍රා යන්ත්‍රයයි.
(3) විද්‍යුත් තැඳවනයයි. (4) ෆැක්ස් යන්ත්‍රයයි.

19. ජාතික නිදහස් දිනයේ දී විකාශනය කිරීම සඳහා රූපවාහිනී නාට්‍යයක් නිර්මාණය කිරීමට ඔබ පාසලේ නාට්‍ය ඒකකයට අවස්ථාව ලැබී ඇත. මේ සඳහා නිර්මාණය කිරීමට උචිත ශෛලී නාට්‍ය වර්ගය වන්නේ,

(1) ප්‍රාසංගික නාට්‍යයකි. (2) ඒකාංගික නාට්‍යයකි.
(3) විවිධාංගික නාට්‍යයකි. (4) මෙගා නාට්‍යයකි.

● ප්‍රශ්න අංක **20** සිට **22** දක්වා පිළිතුරු සැපයීම සඳහා පහත දක්වා ඇති යටිකුරු පිරමිඩ ආකෘතිය භාවිත කරන්න.



20. කිසියම් ප්‍රවෘත්තියකට සෘජුව සම්බන්ධ වූවන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුළත් වීමට වඩාත් ම ඉඩ ඇත්තේ,

(1) A හි ය. (2) D හි ය. (3) B හෝ C හි ය. (4) C හෝ D හි ය.

21. පුවත්පත මුද්‍රණයට ආසන්න ව තිබිය දී වාර්තා වූ වැදගත් පුවතක් නිසා විස්තරාත්මක තොරතුරු ඇතුළත් පුවතින් කොටසක් ඉවත් කිරීමට සිදුවිය. එසේ ඉවත් කිරීමට වඩාත් සුදුසු කොටස වන්නේ,

(1) A ය. (2) D ය. (3) B හෝ C ය. (4) C හෝ D ය.

22. මෙම ආකෘතිය වඩාත් ගැළපෙන්නේ කවර ප්‍රවෘත්ති වාර්තා කිරීමට ද?

(1) දෘඪ ප්‍රවෘත්ති (2) මෘදු ප්‍රවෘත්ති (3) සංවේදී ප්‍රවෘත්ති (4) පාරිසරික ප්‍රවෘත්ති

23. '<u>SFX - ඉරිදා වෙළෙඳපොලක්</u>' යනුවෙන් අදහස් කෙරෙන්නේ,

(1) දුර රූපයකි. (2) ශබ්ද ප්‍රයෝගයකි.
(3) සංස්කරණ උපදෙසකි. (4) සන්නිවේදන ඝෝෂාවකි.

24. පුවත්පතක් සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

- කර්තෘ හිමි පුවත්පතකි.
- 1909 දී ආරම්භ විය.
- එච්.එස්. පෙරේරා මහතා පුරෝගාමියා විය.

උක්ත කරුණුවලට අදාළ පුවත්පත වන්නේ,

(1) ඥාණාර්ථ ප්‍රදීපයයි. (2) සිංහල බෞද්ධයායි.
(3) දිනමිණයි. (4) ලංකාලෝකයයි.

25. රවී විසින් අධ්‍යක්ෂණය කර සංගීත සංයෝජනය කළ කෙටි චිත්‍රපටයක් පන්ති කාමරය තුළ ප්‍රදර්ශනය කිරීමට ඔහුට අවශ්‍ය විය. මේ සඳහා යොදා ගත යුතු උපකරණය වන්නේ,

(1) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (2) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
(3) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (4) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.

26. රාජ්‍ය හිමිකාරිත්වය සහිත මාධ්‍ය පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) ජාතික රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය, ලංකාදීප පුවත්පත
(2) ස්වදේශීය සේවය, ලක්හඬ ගුවන්විදුලිය, දිවයින පුවත්පත
(3) ස්වාධීන රූපවාහිනිය, ලක්හඬ ගුවන්විදුලිය, ලංකාදීප පුවත්පත
(4) ජාතික රූපවාහිනිය, ලක්හඬ ගුවන්විදුලිය, සිළුමිණ පුවත්පත

27. චිත්‍රපට රූගත කිරීම්වල දී අංග රචනය, වස්ත්‍රාභරණ හා පසුතල නිර්මාණ ආදියෙහි අඛණ්ඩතාව පවත්වා ගැනීමට වඩාත් ප්‍රයෝජනවත් වන්නේ,

(1) සංස්කරණයයි. (2) නිශ්චල ඡායාරූපකරණයයි.
(3) අධ්‍යක්ෂකගේ භූමිකාවයි. (4) පිටපතෙහි පැහැදිලි බවයි.

28. කොරෝනා රෝගය වැළඳුනු පුද්ගලයින් පිළිබඳ රූපවාහිනිය ඔස්සේ වාර්තා කිරීමේ දී ඔවුන්ගේ අනන්‍යතාව හෙළි නොකර සිටීමට මාධ්‍ය ආයතන විසින් කටයුතු කරන ලදී. මෙම තත්ත්වයට සෘජුව අදාළ වන්නේ,

(1) මාධ්‍ය ආචාරධර්මයි. (2) සන්නිවේදන බාධකයි.
(3) සිතුවිලි හසුරුවා ගැනීමයි. (4) සංජානනයයි.


29. ශ්‍රී ලංකාවේ පළවන පොතකට ISBN (International Standard Book Number) ලබාදෙන්නේ,

(1) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙනි.
(2) පොත් ප්‍රකාශකයන්ගේ සංගමයෙනි.
(3) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙනි.
(4) පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශයෙනි.

30. ග්‍රන්ථයක කර්තෘ භාගය (Royalty) ලැබීම යනු

(1) මුද්‍රිත කෘති ප්‍රමාණයෙන් අඩක් කර්තෘට හිමිවීමයි.
(2) කෘතිය අලෙවියෙන් ලද මුදලින් අඩක් කර්තෘට හිමිවීමයි.
(3) මුද්‍රිත පිටපත් ප්‍රමාණය මත යම් මුදලක් කර්තෘට හිමිවීමයි.
(4) කර්තෘගේ ජීවිත කාලයෙන් පසුව ද හිමිකම ලැබීමයි.

31.



ඉහත දක්වා ඇත්තේ,

(1) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් වන අතර එය භාවිතයේ දී පූර්ව සූදානමක් අවශ්‍ය ය.
(2) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් වන අතර ඒ සඳහා විනිවිදක පත්‍ර අවශ්‍ය වේ.
(3) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් වන අතර එහි කාචය සීරු මාරු කළ හැකි ය.
(4) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් වන අතර එය දුරස්ථ පාලකයක් මගින් ක්‍රියාත්මක කළ හැකි ය.

32. චීන, කොරියානු හා ජපන් අක්ෂර හැඳින්වීමට වඩාත් යෝග්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ප්‍රාග් මානව භාෂාවලින් විකාශය වී ඇත.
(2) බටහිර භාෂා මූලයන්ගෙන් පෝෂණය වී ඇත.
(3) රූපාක්ෂර හෝ චිත්‍රාක්ෂර ලෙස විකාශය වී ඇත.
(4) කථන භාෂා මුල් කරගෙන ලේඛන භාෂා බවට පත් වී ඇත.

33. වැඩසටහන් විකාශනයේ දී භූගෝලීය සීමා පිළිබඳ අවම සැලකිල්ලක් දක්වන්නේ,

(1) ඩිජිටල් ගුවන්විදුලියයි. (2) වෙබ් ගුවන්විදුලියයි.
(3) ප්‍රජා ගුවන්විදුලියයි. (4) එෆ්.එම්. ගුවන්විදුලියයි.

34. රාමා පාසල් නිවාඩු කාලයක දී සිනමාව හා රූපවාහිනියට වඩා පුවත්පත් හා ගුවන්විදුලි මාධ්‍ය ඇසුරු කළේ ය. මේ කාලය තුළ දී නිර්මාණශීලී සිතුවිලි වැඩි වශයෙන් පහළ වන බව ඔහුට අවබෝධ විය. ඊට හේතුව වන්නේ,

(1) පරිකල්පනයයි. (2) අවබෝධයයි.
(3) පුනර්භාවිතයයි. (4) අතිශෝක්තියයි.

35. මාධ්‍ය ක්‍රියාකාරිත්වය කෙරෙහි රජයේ වක්‍ර මැදිහත්වීමක් පෙන්නුම් කරන අවස්ථාවක් වන්නේ,

(1) හදිසි අවස්ථාවල දී ව්‍යවස්ථානුකූල ව සංදේශ පාලනය කිරීමයි.
(2) ජාතික ආරක්ෂාවට එරෙහි අවස්ථාවල දී වාරණ නියෝග පැනවීමයි.
(3) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය මගින් ආචාරධර්ම පද්ධතියක් ඉදිරිපත් කිරීමයි.
(4) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මාධ්‍ය නාලිකා සඳහා බලපත්‍ර නිකුත් කිරීමයි.

36. කොරෝනා අවදානම හමුවේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා භාවිත කිරීමට වඩාත් සුදුසු මාධ්‍ය යුගලය වනුයේ,

(1) පුවත්පත හා ගුවන්විදුලියයි. (2) ගුවන්විදුලිය හා රූපවාහිනියයි.
(3) රූපවාහිනිය හා අන්තර්ජාලයයි. (4) පුවත්පත හා අන්තර්ජාලයයි.

37. සන්නිවේදන ඉතිහාසයේ සංධිස්ථාන කිහිපයක් පහත දැක්වේ.

A - කථන භාෂාවක් සකස් කර ගැනීම
B - කඩදාසි සොයා ගැනීම
C - රූපාක්ෂර නිර්මාණය කර ගැනීම
D - හෝඩිය නිර්මාණය කර ගැනීම

මෙහි කාලානුක්‍රමික අනුපිළිවෙළ වන්නේ,

(1) A, B, C හා D ය. (2) A, C, B හා D ය. (3) A, C, D හා B ය. (4) C, A, B හා D ය.

38. පුවත්පතක අන්තර්ගත විවිධ තොරතුරු පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ.

A - හාස්‍ය හා උපහාසය දනවමින් තොරතුරු නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි.
B - බලපෑම් සහගත තොරතුරු ඇතුළත් ව රචනා කරයි.
C - පුවත්පතේ රිද්මය හඳුනා ගත හැකි ලියවිල්ලකි.

ඉහත ප්‍රකාශ සඳහා අදාළ වන ආකෘති පිළිවෙලින්,

(1) කාටූන්, ප්‍රවෘත්ති හා සංස්කාරක වැකිය වේ.
(2) ඡායාරූප වාර්තා, තීරු ලිපි හා ප්‍රවෘත්ති වේ.
(3) විශේෂාංග ලිපි, ප්‍රවෘත්ති හා තීරු ලිපි වේ.
(4) කාටූන්, විශේෂාංග ලිපි හා සංස්කාරක වැකිය වේ.

39. ඡායාරූපකරණයේ අනාවරණ ක්‍රියාවලියට අයත් කාර්යයක් වන්නේ,

(1) රූපරාමුව තුළ අඩංගු වස්තූන් නිසි පරිදි සංවිධානය කිරීමයි.
(2) ඡායාරූපයට හසුකර ගන්නේ කුමක්ද යන්න තීරණය කිරීමයි.
(3) ඡායාරූපයට හසුකර ගන්නා අරමුණ පැහැදිලි වන සේ කාචය සීරුමාරු කිරීමයි.
(4) කාච විවරයේ හා ද්වාරයේ පිහිටීම නිසි පරිදි සකස් කොට ආලෝකය පාලනය කිරීමයි.

40. පහත ප්‍රකාශ සළකන්න.

A - ග්‍රාහක චර්යා වෙනස් කරයි.
B - පුද්ගල න්‍යාය පත්‍රය හසුරුවයි.
C - ග්‍රාහක සිතුවිලි හා ආකල්ප හසුරුවයි.
D - ග්‍රාහක ප්‍රතිචාර පිළිබඳ සැලකිලිමත් වෙයි.

මේ අතුරෙන් ග්‍රාහකයා කෙරෙහි මාධ්‍ය බලපෑම පෙන්නුම් කරන්නේ,

(1) A හා B හි පමණි. (2) A, B හා C හි පමණි.
(3) B, C හා D හි පමණි. (4) C හා D හි පමණි.

* *

රහස්‍යයි
அந்தரங்கமானது

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2020

විෂයය අංකය / பாட இலக்கம்: **87**

විෂයය / பாடம்: **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය**

I පත්‍රය - පිළිතුරු
I பத்திரம் - விடைகள்

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.
01.	3	11.	3	21.	2	31.	2
02.	1	12.	4	22.	1	32.	3
03.	3	13.	3	23.	2	33.	2
04.	1	14.	4	24.	3	34.	1
05.	2	15.	2	25.	4	35.	3
06.	4	16.	2	26.	4	36.	3
07.	3	17.	4	27.	2	37.	3
08.	3	18.	4	28.	1	38.	1
09.	3	19.	2	29.	1	39.	4
10.	1	20.	3	30.	3	40.	2

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තර පත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: **25 / 40**

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்: **25 / 40**

II පත්‍රය

ආවරණය කරනු ලබන ඉගෙනුම් ඵල

(01)

01. සන්නිවේදනයේ මූලික කාර්යයන් විස්තර කරයි.
02. විවිධ රූපවාහිනී නාලිකාවල ප්‍රකාශයට පත්වන වැඩසටහන් අධ්‍යයනය කරයි.
03. ජනමාධ්‍ය ආයතන ක්‍රියාකාරිත්වය කෙරෙහි රජයේ මැදිහත් වීමේ ස්වභාවය හඳුනා ගනියි.
04. මාධ්‍ය නිර්මාණ භාවිතයේ දී ආචාර ධර්ම හා නීති පිළිපදිමින් කටයුතු කරයි.
05. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය සිදුවන විවිධ අවස්ථා පෙන්වා දෙයි.
06. සන්නිවේදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් දොරටුපාල සංකල්පය හා බාධක ක්‍රියාත්මක වන ආකාරය හඳුන්වා දෙයි.
07. පුවත්පත් මාධ්‍යයේ නිර්මාණාත්මක ආකෘති හඳුන්වා දෙයි.
08. නව මාධ්‍ය මඟින් මාධ්‍ය ඒකරාශි වී ඇති ආකාරය පිළිබඳ ඇගයීමක යෙදෙයි.
09. ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනයට අවශ්‍ය ශිල්පීය උපාය මාර්ග හඳුන්වා දෙයි.
10. ශ්‍රී ලංකාවට උචිත පරිදි ස්ත්‍රී පුරුෂ සමාජ භාවය යන සංකල්පය නියෝජනය සඳහා රූපවාහිනිය ලබා දෙන දායකත්වය විචාරාත්මකව අගය කරයි.

(02)

(i) සාර්ථක ලෙස සමූහ සන්නිවේදනයේ නියැලීමේ උපාය මාර්ග භාවිත කුසලතා ප්‍රදර්ශනය කරයි.

(ii) කාර්යාලයක ක්‍රියාත්මක වන මාධ්‍ය ක්‍රියාවලිය විස්තර කරයි.

(iii) ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම ආශ්‍රිත ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරයි.

(iv) මුද්‍රිත මාධ්‍ය ලෙස පෝස්ටර් සහ අත් පත්‍රිකාවල විශේෂතා ප්‍රදර්ශනය කරයි.

(03)

(i) විවිධ ප්‍රභේද අනුව පුවත්පත් වර්ගීකරණය කරයි.

(ii) පුවත්පත් අන්තර්ගත සැළකිල්ලට ගෙන නිර්මාණයේ ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

(iii) විද්‍යුත් පුවත්පත් භාවිතයේ විවිධ ස්වරූප විස්තර කරයි.

(iv) පුවත්පත් මාධ්‍යයේ නිර්ාමාණාත්මක ආකෘති හඳුන්වයි.

(04)

(i) ජනසන්නිවේදනය යනු කුමක් දැයි හඳුනා ගනියි.

(ii) වාචික භාෂාව හා ලිඛිත භාෂාව අතර පවත්නා සමාන අසමානතා සන්සන්දනය කරයි.

(iii) ඵලදායි ලේඛනයක ලක්ෂණ විස්තර කරයි.

(iv) සන්නිවේදනයේ මූලික කාර්යයන් විස්තර කරයි.

(05)

(i) ශ්‍රී ලංකාවේ විවිධ මාධ්‍ය ආයතන හිමිකම යටතේ ප්‍රභවය වූ මාධ්‍ය ආයතන පිළිබඳ තොරතුරු අනාවරණය කරයි.

(ii) මාධ්‍ය නිර්මාණය හා සබැඳි නීති පෙන්වා දෙයි.

(iii) කාර්යාල (පන්ති කාමර) මාධ්‍ය උපකරණ භාවිත කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

(iv) කාර්යාල මාධ්‍ය උපකරණ නිවැරදිව භාවිත කරයි.

(06)

(i) මාධ්‍ය නිර්මාණ හා සබැඳි ආචාර ධර්ම හඳුන්වයි.

(ii) මාධ්‍ය සඳහා ග්‍රාහකයන් ප්‍රතිචාර දක්වන විවිධ ස්වරූප පිළිබඳ ඇගයීමක යෙදේ.

(iii) ජනමාධ්‍ය හා නව මාධ්‍යයන් හි ස්වභාවය සන්සන්දනාත්මකව විස්තර කරයි.

(iv) නිර්මාණවල නිර්මාණාත්මක ගුණය ඉහළ නැංවීම සඳහා භාවිත කළ හැකි විවිධ ක්‍රමෝපාය හඳුන්වයි.

(07)

(i) වාචික සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා භාවිත වන විවිධ ක්‍රමෝප විග්‍රහ කරයි.

(ii) ගුවන් විදුලි වැඩ සටහන් ප්‍රභේදවල අන්තර්ගතය විස්තර කරයි.

(iii) තොරතුරු රැස් කරන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග ප්‍රගුණ කරයි.

(iv) මාධ්‍ය ළමයා කෙරෙහි ඇති කරන බලපෑම විචාරාත්මකව විග්‍රහ කරයි.

ලකුණු දීමේ උපදෙස්

I වන අනිවාර්ය ප්‍රශ්නයට කොටස් 10 ක් ඇතුළත් ය. එක් කොටසකට ලකුණු 02 බැගින් පිරිනැමේ.

සෙසු තෝරාගත් ප්‍රශ්නවලට ලකුණු පිරිනැමිය යුත්තේ

I කොටසට	-	ලකුණු	1
II කොටසට	-	ලකුණු	2
III කොටසට	-	ලකුණු	3
IV කොටසට	-	ලකුණු	4
			10

තෝරාගත් ප්‍රශ්න 04 ට $10 \times 4 = 40$

II වන ප්‍රශ්න පත්‍රයේ මුළු ලකුණු සංඛ්‍යාව 60 කි.

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

II පත්‍රය

1. මාධ්‍යවේදිනියක් සමාජ අසාධාරණයට එරෙහිව කරන අරගලය, සිංහලට හඬ කවා විකාශය වන ඉන්දියානු ටෙලි නාට්‍යයක කතා ප්‍රවෘත්තියයි.

(i) ටෙලි නාට්‍යයකින් අපේක්ෂා කරන සන්නිවේදන කාර්යය කුමක් ද?

(ii) ඉහත ටෙලි නාට්‍යය අඩු වියදමකින් නමුත් කොටස් වැඩි ගණනක් සහිත ව විකාශනය වන්නේ නම් එය අයත් ටෙලි නාට්‍ය වර්ගය කුමක් ද?

(iii) විදේශ ටෙලි නාට්‍ය විකාශනය කිරීමේ දී ඍජු රාජ්‍ය මැදිහත්වීමක් පෙන්නුම් කරන ආකාරය කුමක් ද?

(iv) ඉහත නිර්මාණයට සමාන වූවක් මෙරට දී නිෂ්පාදනය කරන්නෙකුගේ ආර්ථික අයිතිය හා සදාචාරාත්මක අයිතිය තහවුරු කෙරෙන ප්‍රධාන නෛතික තත්ත්වය කුමක් ද?

(v) ටෙලි නාට්‍ය ඇසුරෙන් අසන ලද පැනයකට පිළිතුරු ලබා දී ත්‍යාග දිනා ගැනීමට ප්‍රේක්ෂකයෙකු සිතුවේ ය. මෙම සිතුවිල්ල අයත් සන්නිවේදන වර්ගය කුමක් ද?

(vi) අකුණු ගැසීම නිසා ටෙලි නාට්‍ය නැරඹීම අතරමග නවතා දමන්නට සිදුවිය. මෙය කුමන සන්නිවේදන බාධාවක් ද?

(vii) ටෙලි නාට්‍යයේ නිර්මාණාත්මක ලක්ෂණ පිළිබඳ විචාරයක් පුවත්පතක පළ වුණි නම් එම ලිපි ආකෘතිය කුමක් ද?

(viii) ටෙලි නාට්‍ය විකාශනය වී, කෙටි කාලයක් තුළ එය සමාජ මාධ්‍යට උඩුගත කරයි. ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය අතර සුසංයෝගවීමේ මෙම සංකල්පය හඳුන්වන යෙදුම කුමක් ද?

(ix) ඉහත ටෙලි නාට්‍යය ගුවන්විදුලි නාට්‍යයක් බවට පත් කිරීමේ දී භාවිත කළ හැකි ප්‍රධාන හඬ වර්ග දෙකක් නම් කරන්න.

(x) ඉහත ටෙලි නාට්‍යයේ මාධ්‍යවේදිනියගේ භූමිකාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී යොදා ගත හැකි සමාජ විද්‍යාත්මක සංකල්පය කුමක් ද?

(i) විනෝදාස්වාදය

(ii) මෙගා ටෙලිනාට්‍යය

(iii) බදු පැනවීම

(iv) බුද්ධිමය දේපළ පනත

(v) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය

(vi) මාධ්‍ය බාධක

(vii) විශේෂාංග

(viii) මාධ්‍ය අභිසාරිතාව

(ix) ස්වභාවික ශබ්ද, කෘත්‍රිම ශබ්ද, කටහඬ
සංගීතය, නිශ්ශබ්දතාව, ශබ්ද ප්‍රයෝග

(x) ස්ත්‍රී පුරුෂ සමාජභාවය

(ලකුණු 2 x 10 = 20 යි)

2. මැතිවරණ සමයේ දී අපේක්ෂකයකු තම මාධ්‍ය ප්‍රචාරණය පිළිබඳ ව වඩාත් සැලකිලිමත් විය යුතු ය.
(i) ජනතාව ඇමතීමේ දී තමා ඉදිරියේ සිටින සමූහය සමග අපේක්ෂකයා ඇස් සබඳතා පවත්වයි. මෙම ක්‍රියාව හඳුන්වන යෙදුම කුමක් ද?

ප්‍රදිපාගාර උපක්‍රම *(ලකුණු 01යි)*

(ii) මැතිවරණ කාර්යාලයක මාධ්‍ය ක්‍රියාවලියට අදාළ තොරතුරු පාදක කාර්ය දෙකක් නම් කරන්න.

01. තොරතුරු විධිමත්ව ලබා ගැනීම
02. තොරතුරු විධිමත්ව රැස් කිරීම
03. තොරතුරු විධිමත්ව පිළියෙල කිරීම
04. තොරතුරු විධිමත් නිකුත් කිරීම
05. තොරතුරුවල විශ්වසනීයත්වය ආරක්ෂා කිරීම
06. තොරතුරුවල නිරවද්‍යතාව
07. තොරතුරුවල ඉක්මන් බව
08. තොරතුරුවල වලංගු භාවය
09. තොරතුරුවල නෛතික භාවය

(ලකුණු 01 x 2 = 02 යි)

(iii) මැතිවරණයට අදාළව ප්‍රවෘත්ති ඡායාරූපයක් ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

01. කාලෝචිත බව
02. කැපී පෙනීම
03. බලපෑම
04. මානව ඇල්ම
05. අසාමාන්‍ය බව
06. නැවුම් බව
07. ගැටුම්කාරී බව

(ලකුණු 01 x 3 = 03 යි)

(iv) මැතිවරණයක දී පෝස්ටර් භාවිතයේ ප්‍රබලතා හතරක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

1. කෙටි කාලයකින් වැඩි ප්‍රචාරණයක් ලබා ගැනීම
2. සාපේක්ෂව අඩු වියදම් සහිත වීම
3. ග්‍රාහකයා පොළඹවා ගත හැකි වීම
4. ජනතා ආකර්ෂණය දිනා ගත හැකි වීම
5. සරලව කියවා තේරුම් ගත හැකි වීම
6. අනෙකුත් මාධ්‍යන්ට සාපෙක්ෂව පහසුවෙන් තොරතුරු ලබා දීම
7. නියමිත ස්ථානවල සහ සුදුසු ස්ථානවල ඇලවීමෙන් පරිසර හානි අවම කිරීම
8. අදාළ භූගෝලීය කලාපය ඉලක්ක කර ආවරණයන් ලබා දීම

නිදසුන් සහිතව විස්තර කර ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ලකුණු 1 x 4 = 04 යි)

3. පුවත්පත හා ඡායාරූප අතර ඇත්තේ ඉතා සමීප සම්බන්ධයකි.

(i) පළ කෙරෙන වාරය අනුව පුවත්පත් වර්ග දෙකක් නම් කරන්න.

- දිනපතා උදෑසන
- දිනපතා සවස
- සති අන්ත
- සතිපතා හෝ සති මැද
- දෙසති
- මාසික
- වාර්ෂික
- ත්‍රෛයි මාසික

(ලකුණු 01 යි)

(ii) පුවත්පත් වාර්තාවක් සඳහා තෝරා ගනු ලබන ඡායාරූපයක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ දෙකක් දක්වන්න.

- අදාළ සියලු විස්තර ඇතුළත්ව තිබීම
- අනවශ්‍ය දෑ ඇතුළත්ව නොතිබීම
- රාමුව තුළ ඡායා රූපික වස්තූන් මනාව සංවිධානය කර තිබීම
- උචිත කැමරා කෝණය
- නිවැරදි ආලෝකය
- නිවැරදි ආනාවරණය
- ඡායාරූපය සටහන් කර ගන්නා නිසි මොහොත

(ලකුණු 1 x 2 = 02 යි)

(iii) සමකාලීන විද්‍යුත් පුවත්පත්වල දක්නට ලැබෙන පොදු ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න.

- ක්ෂණිකව පුවත් දැන ගැනීමේ හැකියාව
- ගබඩා කර තබා ගැනීමේ පහසුව
- නැවත නැවත කියවිය හැකි වීම
- තොරතුරු විෂයන් අනුව වර්ග කරමින් පළ කොට තිබීම
- යාවත්කාලීන කිරීමේ පහසුකම් වැඩි වීම
- ක්ෂණික පාඨක ප්‍රතිචාර ලැබීම
- පිටපත් කර ගැනීම (Copy) හා බාගත (Downlоard) කර ගැනීමට හැකි වීම

(ලකුණු 1 x 3 = 03 යි)

(iv) පුවත්පතක නිශ්චල ඡායාරූප යොදා ගැනීමේ වාසි හතරක් වෙන වෙන ම පැහැදිලි කරන්න.

1. අදහස් ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීමට ඇති හැකියාව
2. තාත්වික බව නිසා ග්‍රාහක විශ්වසනීයත්වය දිනා ගැනීමට හැකි වීම
3. පහසුවෙන් ග්‍රාහක ආකර්ෂණය ලබා ගැනීමට හැකි වීම
4. පහසුවෙන් මුද්‍රණ තාක්ෂණය හා අනුගත වීමට ඇති හැකියාව
5. ඕනෑම අයෙකුට පහසුවෙන් තේරුම් ගැනීමට ඇති හැකියාව

(ලකුණු 1 x 4 = 04 යි)

4. සන්නිවේදනයේ ස්වභාවය පැහැදිලි කර ගැනීම සඳහා එහි වර්ග සහ ස්වරූප පිළිබඳ අවබෝධය වැදගත් වේ. (i) පොදු සංදේශ සහ සංවිධානාත්මක ආයතනයක් යන ලක්ෂණ දක්නට ලැබෙන සන්නිවේදන වර්ගය කුමක් ද?

ජන සන්නිවේදනය

(ලකුණු 01 යි)

(ii) ලිඛිත භාෂාවේ විධිමත් බව පෙන්නුම් කරන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

- ව්‍යාකරණානුකූල වීම
- නිවැරදි අක්ෂර වින්‍යාසය
- අකුරුවල හැඩයක් තිබීම
- විරාම ලක්ෂණ තිබීම
- ලිවීමේ දී වචන ඇත් කර ලිවීම
- එක් වාක්‍යයක් තවත් වාක්‍යයකින් වෙන් කර දැක්වීම
- එක් ඡේදයක් තවත් ඡේදයකින් වෙන් කර දැක්වීම

(ලකුණු 1 x 2 = 02යි)

(iii) ඵලදායි ලේඛනයක් හඳුනා ගැනීමට උපයෝගී කර ගත හැකි සාධක තුනක් පැහැදිලි කරන්න.

- නිරවුල් බව සහ පැහැදිලි බව
- උචිත ආකෘතියක් යොදා ගැනීම
- නිර්මාණශීලි බව
- සම්මත ව්‍යාකරණ විධි භාවිතය

(ලකුණු 1 x 3 = 03යි)

(iv) 'සන්නිවේදනයේ මූලික කාර්යයන් හතරක්' මැයෙන් සංදේශය නමැති සඟරාවට ලිපියක් සම්පාදනය කරන්න.

- තොරතුරු සම්පාදනය
- අධ්‍යාපනය
- විනෝදාස්වාදය
- පෙළඹවීම
- සමාජානුයෝජන
- සංවාද හා සාකච්ඡා
- සංස්කෘතික ප්‍රගමනය
- ඒකාබද්ධතාවය

සඟරාවකට සපයන ලිපියක ආකෘතියට අනුව රචනා කර තිබිය යුතුය.

(ලකුණු 1 x 4 = 04යි)

5. (i) ශ්‍රී ලංකාවේ පළමු පෞද්ගලික පුවත්පත් ව්‍යාපාරය කුමක් ද?

සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ANCL)/ ලේක් හවුස් ආයතනය

(ලකුණු 01 යි)

(ii) දේශීය ජනමාධ්‍ය ස්ථාපනය කිරීමේ දී දෙයාකාරයක පනත් මූලික විය. එම පනත් වර්ග දෙක මොනවා ද?

- පාර්ලිමේන්තු පනතකින් සංස්ථාවක් ලෙස ස්ථාපිත කිරීම
- සමාගම් පනත යටතේ සීමා සහිත පෞද්ගලික සමාගමක් ලෙස ස්ථාපිත කිරීම

(ලකුණු 02 යි)

(iii) ජනමාධ්‍ය ආයතනයක අභ්‍යන්තර සේවකයන් දැනුවත් කිරීමේ වැඩමුළුවක දී බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් භාවිත කිරීමේ ප්‍රයෝජන තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- විශාල තිරයකට ප්‍රක්ෂේපණය කිරීමට හැකි වීම
- ලේඛන හැඩ, චලන රූප, වීඩියෝ, චිත්‍රපට, සජීවිකරණ දර්ශන ආදී ඕනෑම දෙයක් නැරඹීමට හැකි වීම
- දුරස්ථ පාලකයක් මගින් ක්‍රියාත්මක කළ හැකි වීම
- ඉතා සජීවී, ආකර්ෂණීය හා ඵලදායි ලෙස තොරතුරු ඉදිරිපත් කළ හැකි උපකරණයක් වීම
- වර්ණ භාවිත කිරීමේ හැකියාව
- නිශ්චල ඡායාරූප හා චලන රූප භාවිතයේ හැකියාව
- ශබ්ද භාවිත කිරීමේ හැකියාව

(ලකුණු 03 යි)

(iv) ජනමාධ්‍ය ආයතනවල අභ්‍යන්තර කටයුතු සඳහා පහත සඳහන් එක් එක් උපකරණය භාවිත කිරීමේ අවශ්‍යතා දෙක බැගින් වෙන වෙන ම කෙටියෙන් විස්තර කරන්න.
- දින මුද්‍රා යන්ත්‍රය
- නිල මුද්‍රා යන්ත්‍රය
- තැපැල් මුද්‍රා යන්ත්‍රය
- මුදල් සටහන් යන්ත්‍රය

නිලමුද්‍රා යන්ත්‍රය
- ලිපි අත්සන් තබන ප්‍රධානීන්ගේ අත්සනට නිල හා නිත්‍යානුකූල වලංගුතාවයක් හිමි වීම
- ලිපිය අත්සන් කරන්නාගේ නම, තනතුර, ආයතනය දැන ගැනීමට හැකි වීම

දිනමුද්‍රා යන්ත්‍රය
- ලිපිය ලැබුණු දිනය තහවුරු කර ගත හැකිවීම
- යම් යම් අංශවලට යොමු කිරීමේදී එම දිනය සටහන් කර ගැනීම
- ප්‍රමාද වී ලැබෙන ලිපි ප්‍රතික්ෂේප කිරීමට හැකි වීම
- ලිපියක් සඳහා කටයුතු කිරීමට ගත වූ කාලය දැන ගැනීමට හැකි වීම

තැපැල් මුද්‍රා යන්ත්‍රය
- ලිපි තැපැල් කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නංවා ගැනීම
- මුද්දර ඇලවීමේ කාලය අවම කිරීමට හැකි වීම
- මුද්දර අස්ථාන ගත වීම වැළැක් වීම
- තැපැල් මුද්‍රා යන්ත්‍ර එක් නිලධාරියෙකු භාරයේ තිබීම නිසා වංචා සිදු වීම වැළැක්විය හැකි වීම

මුදල් සටහන් යන්ත්‍ර
- තොරතුරු මතකයේ රඳවා ගැනීමට හැකි වීම
- මුදල් භාරගන්නා තැනැත්තාට මුදල් අයුතු ලෙස රඳවා ගැනීමට නොහැකි වීම
- තොරතුරු පිටපත් දෙකකින් ලබා ගැනීමට හැකි වීම
- මුදල් ගණුදෙනු ඉක්මනින් සිදු කළ හැකි වීම
- මුදල් ගණුදෙනු වඩාත් නිවැරදි ලෙස සිදු කළ හැකි වීම

(ලකුණු 1 x 4 = 04යි)

6. (i) ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍යවලට අදාළ ආචාරධර්ම පද්ධතියක් නම් කරන්න.

- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ ආචාරධර්ම පද්ධතිය
- ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ආචාර ධර්ම පද්ධති/ නිදහස් මාධ්‍ය සංසදයේ ආචාර ධර්ම මාලාව, ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව
- ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේ ආචාරධර්ම මාලාව

(ලකුණු 01 යි)

(ii) පුවත්පතක පළවූ ලිපියක් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා භාවිත කළ හැකි විධික්‍රම දෙකක් දක්වන්න.

i. තැපැල්පත්
ii. දුකරථන ඇමතුම්
iii. විද්‍යුත් තැපැල
iv. කෙටිපණිවිඩ
v. සමාජ ජාල හා වෙබ් අඩවි
vi. පුවත්පත්වලට ලිපි සම්පාදනය
vii. ලිපියක් ලෙස සකසා ප්‍රතිචාර දන්වා යැවීම/ කර්තෘට ලියුම්
viii. මාධ්‍ය පාගමන් හෝ උද්ඝෝෂණ සංවිධානය කිරීම
ix. පාඨක සමාජ

(ලකුණු 02 යි)

(iii) ජනමාධ්‍යවලින් නව මාධ්‍ය වෙනස් වන ආකාර තුනක් පැහැදිලි කරන්න.

- ජනමාධ්‍ය තුළ භූගෝලිය වශයෙන් සීමා පැවතිය ද නව මාධ්‍ය තුළ එසේ භූගෝලීය සීමා නොමැති වීම
- ජනමාධ්‍ය තුළ පොදු සංදේශ දක්නට ලැබෙන අතර, නව මාධ්‍ය තුළ ග්‍රාහකයාට අභිමත පරිදි සංදේශ තෝරා ගෙන පරිහරණය කළ හැකි වීම
- නව මාධ්‍ය අංකිත තාක්ෂණ පදනම් කරගෙන ඇති අතර, ඇතැම් ජනමාධ්‍ය අංකිත තාක්ෂණය පදනම් කරගෙන නැත
- ජනමාධ්‍ය ගෝලිය වශයෙන් ව්‍යාප්ත නොවන අතර, නව මාධ්‍ය ගෝලීය වශයෙන් ව්‍යාප්තව පවතී
- නව මාධ්‍යයට සම්බන්ධ වන සියලු දෙනාට අන්තර් ක්‍රියාකාරී ලෙස තොරතුරු හුවමාරු කර ගැනීමට හා සංස්කරණය කර ගැනීමට හා නිර්මාණ කර ගැනීමට හැකි අතර ජන මාධ්‍ය සංදේශ එසේ කළ නොහැක.

(ලකුණු 03 යි)

(iv) නිර්මාණාත්මක සන්නිවේදනයේ දී යොදා ගත හැකි ප්‍රකාශන විධි දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න.

- භාෂාත්මක ප්‍රකාශන විධි
    - උපමා උපමේයන්, ප්‍රස්ථා පිරුළු, කෙටි කතා, ව්‍යාංගාර්ථ සහිත භාෂා රටා
- දෘශ්‍ය ප්‍රකාශන විධි
    - අකුරු, අභිනය, ඡායාරූප, චිත්‍ර, සංකේත, සංඥා, වගු, ප්‍රස්තාර
- ශ්‍රව්‍ය ප්‍රකාශව විධි
    - බෙර හඬ, හුව, නලා හඬ, විරිදු, ගුවන් විදුලි නාට්‍ය, සංගීතය
- ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධි
    - නාට්‍ය, රූකඩ, සිනමාව, රූපවාහිනිය, අන්තර්ජාලය ආශ්‍රිත නව මාධ්‍ය

(ලකුණු 1 x 4 = 04 යි)

7. කොවිඩ් 19 වසංගතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක දී වෛද්‍යවරයා විවිධ වාගලංකාර හා භාව ප්‍රකාශන යනාදිය භාවිත කරමින් අර්ථවත් දේශනයක් සිදු කළේ ය.

(i) ඉහත වාචික සන්නිවේදන අවස්ථාවේ දී වෛද්‍යවරයා භාවිතයට ගෙන ඇති භාෂා අංගය කුමක් ද?

අර්ථ ගැන්වීම

(ලකුණු 01 යි)

(ii) ඉහත වසංගත අවස්ථාවට විශේෂිත ගුවන්විදුලි නිවේදනයකට අදාළ කොටස් දෙකක් නම් කරන්න.

- කටහඬ පමණක් යොදා ගන්නා අවධාරිත නිවේදන (Spot Announcements)
- කිංකිණි නිවේදන (Jingles)
- වෙළඳ නිවේදන (Advertisement)

(ලකුණු 02 යි)

(iii) වසංගත තත්ත්වය පිළිබඳ තොරතුරු රැස් කරන්නෙකු ලෙස ඔබ ඉහත වැඩසටහනට සහභාගි වන්නේ නම්, ඔබ තුළ තිබිය යුතු ගුණාංග තුනක් කෙටියෙන් විස්තර කරන්න.

- පුවත් ඉව
- තොරතුරු මූලාශ්‍රය පිළිබඳ දැනුවත් බව
- ඉවසීම
- හොඳ නිරීක්ෂකයෙකු වීම
- ආචාරශීලී බව
- සුහද බව
- කාල කළමනාකරණය
- විචක්ෂණ බව
- අපක්ෂපාති බව
- ස්ථිරසාර බව
- උපායශීලි බව

(ලකුණු 03 යි)

(iv) ඉහත වාතාවරණය තුළ දීර්ඝ කාලයක් ළමයින් රූපවාහිනිය නැරඹීමට පෙළඹීම නිසා සිදුවිය හැකි යහපත් හා අයහපත් බලපෑම් දෙක බැගින් විස්තර කරන්න.

යහපත් බලපෑම්

- රසඥතාව දියුණු වීම
- සිරිත් විරිත් ඉගෙනීම
- රසවිඳීමට ඉගෙනීම
- අධ්‍යාපනික වැඩ සටහන් නැරඹීමට නැඹුරු වේ
- සංකෘතිකාංග හඳුනා ගැනීම
- සමාජානුයෝජනය

අයහපත් බලපෑම්

- සාම්ප්‍රදායික භාෂාව වෙනස් වීම
- අවරගණයේ රස වින්දනයට හුරු වීම
- මාධ්‍ය වැඩසටහන්වලින් නිරූපිත චරිත ළමුන්ගේ වීරයන් බවට පත් වීම
- සමාජ සංස්කෘතියට නොගැළපෙන විලාසිතාවලට යොමු වීම
- ළමයා ප්‍රචණ්ඩත්වයට යොමු වීම
- ඵලදායි නොවන හුරුපුරුදුවලට යොමු වීම නිසා තම කාලය හා ධනය නිකරුනේ වැය වීම
- ඵලදායි නොවන අපේක්ෂාවන් පසුපස හඹා යාමට ළමයා පෙළඹවීම තුළ ජීවිත ආසාර්ථක වීම
- ඇබ්බැහි වීම
- රූපවාහිනිය මගින් දකින ලෝකය හා සැබෑ ලෝකය අනන්‍ය ලෙස සැලකීමට පෙළඹවීම

(ලකුණු 2 x 2 = 04 යි)